 ISSN 2362-0412

# බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය තුළින් වෙනස් වූ ශ්‍රී ලාංකේය සමාජය

කාන්ති ජයසිංහ*

*ඉතිහාසය අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

**සංක්ෂේපය**

ක්‍රි.ව. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගත් බ්‍රිතාන්‍යයෝ ක්‍රි.ව. 1815 වන විට සමස්ත දිවයින ම යටත් කර ගත්හ. එසේ යටත්විජිතයක් බවට පත්කර ගැනීමත් සමඟ ශ්‍රී ලංකාවේ විශාල ප්‍රදේශයක වතු වගාව ව්‍යාප්ත කිරීමට ඔවුහු පියවර ගත්හ. එමෙන් ම එවකට බ්‍රිතාන්‍යයේ ප්‍රචලිත වෙමින් පැවති ධනවාදී ආර්ථික සංකල්පය තම යටත්විජිත තුළ දී ද ක්‍රියාත්මක කිරීම හා එම ක්‍රියාමාර්ග තුළින් උපරිම ආර්ථික වාසි ලබා ගැනීම මූලික අරමුණ කර ගත් බ්‍රිතාන්‍යයෝ එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ ම වූ ඉඩම් ප්‍රතිපත්තියක් හඳුන්වා දීම කෙරෙහි උත්සුක වූහ. ලංකාවේ ක්‍රියාත්මක වූ ස්වයංපෝෂිත ආර්ථික රටාව බ්‍රිතාන්‍යයන් බලාපොරොත්තු වූ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී පැවති ප්‍රබල බාධාවක් විය. ලංකාවේ එතෙක් ක්‍රියාත්මක කළ කෘෂිකාර්මික බෝග වෙනුවට ජාත්‍යන්තර වෙළඳපොළෙහි අළෙවි කර උපරිම ලාභ ලැබිය හැකි වාණිජ බෝග ව්‍යාප්ත කිරීමට බ්‍රිතාන්‍යයෝ බලාපොරොත්තු වූහ. ඒ සඳහා දේශීය ඉඩම් ප්‍රතිපත්තිය වෙනසකට ලක් කිරීමේ අවශ්‍යතාව අවබෝධ කර බ්‍රිතාන්‍යයෝ ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය ධනවාදී ආර්ථිකයට ගැලපෙන ආකාරයෙන් සකස් කර ගැනීම සඳහා 19 වන සියවසේ මුල් භාගයේ සිට විසිවන සියවසේ මැද භාගය දක්වා ඔවුන් විසින් වරින් වර ඉඩම් පනත් කීපයක් හඳුන්වා දුන්හ.

ක්‍රි. ව. 1840 සිට 1935 දක්වා බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ඉඩම් පනත්වලින් මෙරට ආර්ථික සහ සාමාජීය වශයෙන් බොහෝ වෙනස්වීම් සිදු විය. ඒ අතරින් ප්‍රධාන ස්ථානයක් හිමි කර ගනු ලැබුවේ පන්ති සංයුතියේ ඇති වූ වෙනස්වීම ය. වතු වගාව සීඝ්‍රයෙන් ලංකාව තුළ ව්‍යාප්ත වීමත් සමඟ ඒවායෙන් ලාභ උපයාගත් ඉඩම් හිමි ධනපති පන්තියක් හා ඔවුන්ගේ ඉඩම්වල සේවය කරමින් ජීවිතය පවත්වා ගෙන ගිය ඉඩම් අහිමි සහ ජීවත්වීමට තරම් ප්‍රමාණවත් ඉඩමක් නැති කම්කරු පන්තියක් ලංකාව තුළ නිර්මාණය විය. එසේ ඇති වූ වෙනස්වීම් පිළිබඳ ව මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කෙරේ.

ප්‍රමුඛපද : ඉඩම් පනත්, බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය, බ්‍රිතාන්‍ය පාලනය, ස්වයංපෝෂිත ආර්ථිකය, වාණිජ බෝග

* *jkajayasinghe@yahoo.com*